**26-03-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ආශ්‍රය කරන අයගේ දුර්ගුණයන්ට යටවීමෙන් තමාව ආරක්ෂා කරගෙන ඉගෙනීම කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කරන්න. ඉන්පසු කිසිම කුණාටුවකට ඔබ වෙත පැමිණිය නොහැක. මායාට දෝෂාරෝපණය කරන්න එපා!

**ප්‍රශ්නය:** ඔබේ ඔරුව එතෙර වී යා හැකි කුමන කරුණ වෙතද ඔබ නිරන්තරයෙන්ම අවධානය යොමුකළ යුත්තේ?

**පිළිතුර:** 'බාබා, ඔබේ අණ කුමක් වුවත්!' යන්න කෙරෙහියි. නිරන්තරයෙන් නොකඩවා පියාගේ අණ පිළිපදින්න. එවිට ඔබගේ ඔරුව එගොඩ වනු ඇත. ඒ අණ පිළිපදින අය මායාගේ පහරදීම් වලින් ආරක්ෂාවනු ඇත. ඔවුන්ගේ බුද්ධියට වැටී ඇති අගුල ඇරෙන අතර ඔවුන් කිසිම විටෙක කිසිමාකාරයක වැරදි ක්‍රියාවක් නොකරනු ඇත.

**ගීතය:** ඔබ හමුවීමෙන් මම මුළු ලෝකයම සොයා ගතිමි...

ඕම් ශාන්ති. සෑම මධ්‍යස්ථානයකම සිටින සෑම සුමිහිරි වූ දරුවෙක්ම ගීතයට සවන් දුන්නා. ඔබ සැමටම තේරෙනවා මීට හරියටම අවුරුදු 5000 ට ප්‍රථම වූවා සේම නැවතත් ඔබ ඒ අසීමිත පියාගෙන් මුළු ලෝකයේම අධිකාරීත්වය ලබාගන්නවා. සෑම චක්‍රයකදීම අපි එය ලබා ගත්තා. අප රාජ්‍යය ලබා නැවත එය නැතිකර ගත්තා. දරුවනි, දැන් ඔබට තේරෙනවා ඔබ දැන් ඒ අසීමිත පියාගේ ඔඩොක්කුවට ගොස් තිබෙන බව. ඒ කියන්නේ ඔබ ඔහුගේ දරුවන් බවට පත්ව සිටිනවා යන්නයි. සත්‍ය වශයෙන්ම ඔබ එම තත්ත්වයට පත්ව සිටිනවා. නිවසේ සිටින අතරම ඔබ උත්සාහයෙහි යෙදෙනවා. ඒ අසීමිත පියාගෙන් උසස් තත්ත්වයක් ලැබීම උදෙසා මෙම අධ්‍යාපනය දිගින් දිගටම කරගෙන යන්න. ඔබ දන්නවා ඒ දැනුම් සාගරය, පාරිශුද්ධකරුවා, සැමදෙනාටම විමුක්තිය ලබාදෙන්නා, ශිව බාබා තමයි අපේ පියා, ගුරුවරයා හා සත්ගුරු වන්නේ. අපි ඔහුගෙන් අපගේ උරුමය ලබා ගන්නවා. එමනිසා, අපි උසස් තත්ත්වයක් ලැබීම උදෙසා උත්සාහ දැරිය යුතුමයි. අවිද්‍යා මාර්ගයේ දරුවන් පාසලේ ඉගෙන ගන්නා විට ඔවුන් පාඩම් කරන ආකාරය අනුව අනුපිළිවෙලින් තමයි ලකුණු ලැබෙන්නේ. එහිදී මායා තමන්ට බාධා පමුණුවන බව හෝ මායා කුණාටු ගෙනෙන බව කිසිම කෙනෙක් කියන්නේ නැහැ. එක්කෝ ඔවුන් ඉගෙන ගන්නේ නැහැ, නැති නම් නරක ආශ්‍රයට වැටෙනවා ඔවුන් ක්‍රීඩාවලම නිරත වෙමින් සිටිනවා. මේ නිසා තමයි ඔවුන් ඉගෙන ගන්නේ නැතිව ප්‍රපාතයට ඇද වැටෙන්නේ. කොහොමනමුත්, එය මායාගේ කුණාටු ලෙස හඳුන්වන්න බැහැ. කෙනෙකුගේ හැසිරීම් හොඳ නොවන අවස්ථාවකදී, ඔහුගේ චරිතය ඔහු සිටින නරක ඇසුර නිසා නරක් වී තිබෙන බවටත්, එය ඉතා හොඳ නොවන බවටත් ගුරුවරයා ඔහුට සහතිකයක් දෙනවා. මෙහිදී මායාට, රාවන්ට කිසිම ලෙසකින් දොස් පැවරිය නොහැකියි. සමහර ශිෂ්ට වැදගත් අයගේ දරුවන් ඉතාම හොඳ වන අතර තවත් සමහරු නරක ඇසුරට වැටී මත්ද්‍රව්‍ය ආදියට අබ්බැහි වෙනවා. ඔවුන් වැරදි, කිලිටි වූ දිශාවක යනවා. එවිට ඔවුන්ගේ පියා කියනවා ඔහුගේ සියලු උරුමයන් නැති වී ගොස් තිබෙනවා කියා. අනෙක් අධ්‍යාපනයෙහි නොයෙකුත් විෂයන් තිබෙනවා. මෙහි තිබෙන්නේ එකම ආකාරයක අධ්‍යාපනයක් පමණයි. එහි උගන්වන්නේ මනුෂ්‍යයන් වන නමුත් මෙහිදී ඔබ දන්නවා ඔබට උගන්වන්නේ පරමාත්ම දෙවියන් බව. ඔබ හොඳින් ඉගෙන ගත හොත් ඔබට ලෝක පාලකයන් බවට පත්විය හැකියි. දරුවන් බොහොමයක් සිටිනවා සමහරුන්ට නරක ඇසුරට ගොදුරු වීම නිසා ඉගෙන ගැනීමට නොහැකි වෙනවා. ඔබ එය මායාගේ කුණාටුව ලෙස හඳුන්වන්නේ ඇයි? කෙනෙක් නරක ඇසුර නිසා ඉගෙන ගන්නේ නැත්නම් මායාට, ගුරුවරයාට හෝ පියාට කළ හැක්කේ කුමක්ද ? ඔවුන්ට ඉගෙන ගන්න බැරිවන විට ගෙදර යන එක තමයි කරන්නේ. නාටකයට අනුව ප්‍රථමයෙන් ඔවුන් එක බතියකට පැමිණිය යුතුව තිබුණා. ඔවුන් පැමිණ ආරක්ෂාව ලැබුවා. සමහරුන්ට පහරවලට ලක්වන්නටත්, ස්වාමි පුරුෂයන්ගේ බාධා වලට මුහුණ දෙන්නටත් සිදුවුවා. තවත් සමහරුන් නිරාශාවට පත් වූවා. ඔවුන් ගෙදර සිටිය නොහැකි හෙයින් මෙහි පැමිණියා, නමුත් පසුව මෙයද අතහැර ගියා. ඔවුන්ට ඉගෙන ගන්න නොහැකි වූ හෙයින් රැකියාවක් සොයා ගත්තා. නැතිනම් විවාහ වූවා. මෙහිදි, ඔවුන් සමාවට කරුණ ලෙස හදාගන්නේ මායාගේ කුණාටු වලට හසුවන නිසා තමන්ට ඉගෙන ගන්න බැහැයි යන්නයි. නමුත් මෙසේ සිදුවන්නේ තමා තුළ ඉතා ගැඹුරු ලෙස පාපයන් කා වැදී තිබෙන නිසා හා නරක ඇසුර නිසා බව ඔවුන් වටහා ගන්නේ නැහැ. මායාගේ කුණාටු වලට ගොදුරු වූ නිසා තමයි තමා මෙසේ

වැටුනේ කියා ඔබ කියන්නේ ඇයි? ඒ සෑම දෙයක්ම තීරණය වන්නේ ඔබ මතයි! ඔබ පියාගෙන්, ගුරුවරයාගෙන් හා සත්ගුරුගෙන් ලබා ගත් එම ඉගැන්වීම් අනුගමනය කරන්න. ඔබ ඒවා අනුගමනය කරන්නේ නැත්නම්, එයින් කියන්නේ ඔබ රාගය හෝ ශරීර අවධානය යන නරක ඇසුරුවලට ගොදුරු වී සිටිනවා යන්නයි. සෑම මධ්‍යස්ථානයකම සිටින දරුවන්ට තේරෙනවා, ඔබ අසීමිත වූ පියා සමඟ ඉගෙන ගන්නේ ඒ ලෝක අධිරාජ්‍යය ලබා ගැනීම උදෙසා බව. ඔබට මෙම ශ්‍රද්ධා විශ්වාසවය නොමැතිනම් මෙහි ඉඳගෙන ඉන්නේ ඇයි? තවත් බොහෝ ආශ්‍රම තිබෙනවා. නමුත් ඒවායින් ලබා ගත හැකි දෙයක් නැහැ. එහි කිසි ඉලක්කයක් හෝ අරමුණක් හෝ නැහැ. ඒ සෑම දෙයක්ම පුංචි පුංචි ව්‍රත ඇඳහිලි, නැති නම් අතු හෝ අතුවල තිබෙන නාරටි වැනියි. ගස වැඩිය යුතුමයි. මෙහිදී මේ සෑම දෙයක්ම සම්බන්ධයි. ඒ මිහිරි වූ දිව්‍ය ගසට අයත් අය මෙහිදී මතුවෙනවා. සෑමටම වඩා මිහිරිතම කෙනා කවුද ? සත් යුගයේදී අධිරාජ්‍යයන් හා අධිරාජිනියන් වන අයයි. පළමුවන නොම්මරය ලබා ගත් අය ඉතාමත් හොඳින් ඉගෙනගෙන ඇති බව ඔබට දැන් වැටහෙනවා. ඔවුන් සූර්යවාංශික රාජ්‍යයට ගියා. නිවසේ සිටිය ගමන්ම බාබාට කැප වී විශාල සේවයක යෙදෙන බොහෝ දෙනා සිටිනවා. එහි විශාල වෙනසක් තිබෙනවා! සමහරු මෙහි සිටියත් ඔවුන්ට ඉගෙන ගන්න බැහැ, ඒ නිසා ඔවුන් වෙන වෙන වැඩවල යෙදෙනවා. අවසානයේදී මදක් ඔවුන් රාජකීය වූ තත්වයක් ලබා ගන්නවා. නිවෙස්වල සිටින අය ඉගෙනීමේදීත්, අන් අයට ඉගැන්වීමේදීත් ඉතාමත් සීඝ්‍රයෙන් ඉදිරියට යන බව දක්නට ලැබෙනවා. සෑම කෙනෙක්ම ගෘහ ජීවිත ගත කරන අය නොවේ. කුමාරයන් හා කුමාරියන් ගෘහ ජීවිත ගත කරන අය ලෙස හැඳින් විය නොහැකියි. අවුරුදු 60 දී විශ්‍රාම යන අය සෑම දෙයක්ම ඔවුන්ගේ දරුවන්ට දී පූජකවරයෙක් සමඟ විසීමට යන සිරිතක් තිබුණා. අද කාලයේ සෑම කෙනෙක්ම තමෝප්‍රධාන් වන නිසා ඔවුන් මිය යෑමට ආසන්න වන තුරුම තමන්ගේ ව්‍යාපාර ආදියවත් අතහරින්නේ නැත. මුල් දවස් වලදී නම් මිනිස්සු 60 වැනි වියේදී විශ්‍රාම කියා, ඔවුන් බරණැසට ගොස් වාසය කරනවා. දරුවනි, ඔබ දන්නවා කිසිම කෙනෙකුට තවම නිවස වෙත යා නොහැකි බව. කිසිම කෙනෙකුට දැන්ම විමුක්තිය ලද නොහැකියි. පියා පමණයි මුක්තිය හා ජීවන මුක්තිය ලබා දෙන්නා වන්නේ. සෑම කෙනෙක්මත් ජීවන මුක්තිය ලබන්නේ නැහැ. සමහරු නිර්වාණයට යනවා. දැන් ඒ ආදී සනාතන දේවී දේවතා ධර්මය ස්ථාපිත වෙමින් පවතිනවා. පසුව එකිනෙකා යොදනු ලබන උත්සාහය අනුව තමන් යායුතු තැන තීරණය වනවා. මෙහිදීත් කුමාරීන්ට ඉතා හොඳ අවස්ථාවක් තිබෙනවා. ඔවුන් පාරලෞකික පියාගේ උරුමකරුවන් බවටත් පත් වෙනවා. මෙහිදී පියාගෙන් උරුමයක් ලැබීමට සෑම කෙනෙකුටම අයිතියක් තියෙනවා. සාමාන්‍යයෙන් නම් දූවරුන්ට ධනය ලැබෙන්නේ නැහැ. ධනය සඳහා පුතුන් හරිම ලෝභයි. තමන්ට ලැබිය යුතු උරුමය අනිවාර්යෙන්ම ලබා ගත යුතුය, එය නැති කර ගන්නේ මන්ද කියා තමන්ට හැඟෙන අයත් ඉන්නවා. ඔවුන් ඉගෙනීම් දෙකම කරනවා. නොයෙකුත් ආකාරයේ දරුවන් ඉන්නවා. ඔබ දන්නවා හොඳින් ඉගෙන ගන්නා අය උසස් ස්ථානයක් හිමි කර ගන්නා බව. සේවකයන් අතර ඔවුන් බොහෝ ධනවත් අය බවට පත්වෙනවා. මෙහි ජීවත්වන අය මාළිගා තුළ වාසය කරාවි ඔවුන් උපස්ථායකයන් හා සේවකයන් වේවි. ඔවුන් සමහර විට රිදී යුගය අවසානයේදි උපත් 3 ක්, 4 ක් හෝ 5 ක් ලබනු ඇත. සත් යුගයේ මුල සිටම ධනවත්ව සිටින ධනවත් අය ඊට වඩා ටිකක් හොඳයි. නිවෙස්වල සිටින අයට උසස් තත්ත්වයක් නොලැබිය හැක්කේ මන්ද? ඔවුන් රාජකීය තත්ත්වයක් ලැබීමට උත්සාහ කරනවා. කොහොමනමුත්, ඔබ ලිස්සා වැටුණ හොත් සේවකයන් අතර උසස් ස්ථානයක් හිමි කර ගැනීමට උත්සහා දැරිය යුතුයි. එයද උසස් තත්වයකි. පිට ඉන්න අයට ඇතුලේම සිටින අයට වඩා උසස් ස්ථානයක් හිමි කර ගත හැකියි. සෑම දෙයක්ම තීරණය වන්නේ ඔබ විසින් දරණු ලබන උත්සාහය අනුවයි. උත්සාහය සැඟවී තිබිය නොහැකියි. සියලු විෂයන්ගෙන් ධනවත් බවට පත් වන අය සැඟවී නොසිටීවි. පිටත සිටින අය ලබන්නේ අඩු තත්ත්වයක් කියා දෙයක් නැත. අවසානයේදි ඉහළ තත්ත්වයක් ලබා ගැනීම ද නැතිනම් මුලදි ධනවත් තත්ත්වයක් ලබා ගැනීමද වඩාත් හොඳ? නිවසේ ඔවුන්ගේ පවුලේ අයත් සමඟ සිටිනා අය මායාගේ කුණාටු එතරම් අත්දකින්නේ නැහැ. මෙහි ඉන්නා අය බොහෝ කුණාටුවලට හසුවෙනවා. ඔවුන්ට ඉතාමත් හොඳ ධෛර්යයක් තිබෙනා අතර ශිව බාබාගේ රැකවරණය යටතේ සිටිනවා. නමුත් ආශ්‍රයේ බලපෑම නිසා ඔවුන් ඉගෙන ගන්නේ නැහැ. අවසානයේ සියල්ල දැන ගැනීමට ලැබෙයි. සෑම කෙනෙක්ම ලබාගන්නා තත්ත්වය ගැන දර්ශන පහළ වේවි. සෑම කෙනෙක්ම ඉගෙන ගන්නේ අංක පිළිවෙලටයි. ඇතැම් අය තමා විසින්ම මධ්‍යස්ථාන කරගෙන යනවා. ඇතැම් තැන්වල ඉගෙන ගැනීමට පැමිණෙන අය මධ්‍යස්ථාන ගෙන යන අයට වඩා හොඳින් ඉදිරියට යනවා. සියල්ල රඳා පවතිනුයේ ඔබ දරණ උත්සාහය මතයි. මායාගේ කුණාටු එනවා නොවෙයි නැහැ. ඔබගේ හැසිරීමද යහපත් නොවන අතර, ඔබ ශ්‍රීමත් අනුගමනය කරන්නේද නැත. ලෞකික පවුලකත් එය එසේමයි. ළමයි තම ගුරුවරුන්ගේ හා දෙමාපියන්ගේ උපදෙස් අනුගමනය කරන්නේ නැහැ. තමාගේම කියා පියෙක් නොමැති පියාගේ දරුවන් බවටයි ඔබ පත් වී ඇත්තේ. එහි (පිටත

ලෝකයේ), බොහෝ සෙයින් නොමඟ ගොස් සිටිනවා. ඇතැම් දරුවන් නරක ආශ්‍රයට ඉතාමත් ප්‍රබල ලෙස හසු වීම නිසා පරාජය වෙනවා. මායාගේ කුණාටු තිබෙනවා කියා ඔවුන් කියන්නේ ඇයි? ඒ ඔවුන්ගේම අනුවණකමයි. උපදෙස් අනුගමනය නොකර කරනා එවන් හැසිරීම් නිසා ඔවුන් පරාජයට පත්වෙනවා. බොහෝ දරුවන් ඉතාමත් කැදරයි. ඇතැම් අයට කෝපයත්, තවත් සමහර අයට සොරකම් කිරීමේ පුරුද්දත් තිබෙනවා. අවසානයේදි සියල්ල දැන ගැනීමට ලැබේවි අසවල් කෙනා මෙවන් හැසිරීම් රටාවක් නිසා සියල්ල අතහැර ගියා. ඔහු ආපසු ගොස් ශුද්‍ර වංශයට අයත් වුණු බව වැටහෙනු ඇත. එවිට ඔහුව බ්‍රහමින් කෙනෙක් වශයෙන් හැඳින්විය නොහැකිය. ඉගෙනුම අතහැර ගොස් ඔහු නැවතත් ශුද්‍රයෙක් බවට පත් වුණා. පොඩි හෝ දැනුමකට ඇහුම්කන් දුන් අය පුරවැසියන් අතර කොටසට පැමිණෙනු ඇත. ගස ඉතාමත් විශාලයි අන් අය කිනම් හෝ තැනකින් මතුවනු ඇත. දේවතා ධර්මයට අයත්ව සිට වෙනත් ආගම් වලට හැරුණු අය නැවතත් මතුවේවි. බොහෝ දෙනා පැමිණෙන අතර සියලු දෙනාම පුදුමයට පත් වේවි! අන් ආගම්වල අයටත් ඔවුන්ගේ මුක්තියේ උරුමය ලබාගත හැකියි! ඕනෑම කෙනෙකුට මෙහි පැමිණිය හැකියි. තමාගේම රාජ්‍යයේ උසස් තත්ත්වයක් හිමි කර ගැනීමට ඔවුනට අවශ්‍ය නම්, ඔවුන් පැමිණ තමන්ගේ ඉලක්කය මෙහිදී ලබා ගනීවි. ඔවුන් මෙහි සිටිය විට පමණයි තමන්ගේ ඉලක්කය ලබා ගන්නේ කියා දෙයක් නැත. ඕනෑම ආගමක, ඕනෑම අයෙකුට ඔහුගේ ඉලක්කය ගත හැකියි. ඔවුන් ලබනා ඉලක්කය නම් පියා සහ සාමයේ දේශය සිහිපත් කරන්න. එවිට ඔබ තමාගේ ආගම තුළ උසස් තත්ත්වයක් ලබාගනු ඇත. ඔවුන් ජීවන මුක්තිය ලබාගන්නේත් නැහැ, ඒ වෙත යන්නේත් නැහැ. ඔවුන්ගේ හදවත එයත් සමඟ එකතු වන්නේ නැහැ. මෙම ධර්මයට පමණක්ම අයත් අය පමණක් තම හදවත ඒ වෙත සම්බන්ධව තබාගනීවි. අවසානයේදී ජීව තම පියාව හඳුනාගත යුතුයි. බොහෝ මධ්‍යස්ථානවල ඉගෙනුම සඳහා හොඳ අවධානයක් යොමු නොකරන බොහෝ දෙනෙක් සිටිනවා. ඔවුන් උසස් තත්ත්වයක් හිමිකර නොගන්නා බව ඉන් පැහැදිලියි. ශ්‍රද්ධා විශ්වාසයක් ඔවුන්ට තිබුණානම් තමාට කාලය නැහැයි කියා කිසිම කෙනෙක් කියනා එකක් නැහැ. කොහොමනමුත්, එය ඔවුන්ගේ වාසනාවේ නොතිබෙන නිසා වෙන වෙන දේවල් කිරීමට යාම නිසා කාලය නැතැයි කියා ඔවුන් කියනවා. වාසනාවේ තිබුණානම් දිවා රෑ ඔවුන් ඒ උත්සාහයේ නිරත වී සිටීවි. ඉදිරියට යන අතරේ නරක ආශ්‍රය නිසා ඔවුන් නරක් වී තිබෙනවා. එයත් නරක අපලයක් ලෙසින් හැඳින්විය හැකියි. ඉහළම බල ඇති අපල ඉතාමත් අඩු බලයක් ඇති ඒවා බවට වෙනස් වී ඇත. ඇතැම් විට ඉදිරියට යන අතරේ ඒවා ඉවත්විය හැකියි. ඇතැම් අයට බාබා කියනවා නරක අපල තිබෙන්නේ ඔවුන් ලඟයි. ඔවුන් සත්‍යයට ඇහුම් කන් දෙන්නේවත් නැහැ. මේ කතා කරන්නේ බ්‍රහ්මායි කියා ඔවුන් සිතනවා. තමන්ට උපදෙස් දෙන්නේ කවුදැයි කියාවත් ඇතැම් දරුවන් තේරුම් ගන්නේ නැහැ. ශරීර අවධානය නිසා මෙම දැනුම දෙන්නේ මේ ශාරීරික කෙනා විය හැකි බව ඔවුන් සිතනවා. ජීව අවධානයෙන් සිටියානම් ශිව බාබා විසින් කියා දෙන සියලු දේ තමා විසින් කළ යුතු බව ඔවුන් තේරුම් ගනීවි. එවිට වගකීම පැවරෙන්නේ ශිව බාබාටයි. ඔබ ශිව බාබාගේ උපදෙස් අනුගමනය කළ යුතුයි. ශරීර අවධානයට පත්වීම නිසා ඔවුන් ශිව බාබාව අමතක කර දමලා. එවිට ශිව බාබාට බැහැ වගකීම බාරගන්න. ඔහුගේ අණ ඔබගේ හිසට උඩින් යායුතුයි. කොහොමනමුත්, තමන්ට කතාකරන්නේ කවුදැයි ඔවුන් තේරුම් ගන්නේ නැහැ. වෙන කිසිම කෙනෙක් ඔබට අණ දෙන්නේ නැහැ. පරමාත්ම පියා පමණයි මම ඔබට ශ්‍රීමත් ලබා දෙනවා කියා කියන්නේ, පළමුවෙන්ම මා සිහිපත් කරන්න. මා ඔබට කියාදෙන දැනුම හදාරන්න. අන් අයවත් ඒ සඳයා උනන්දු කරවන්න. මේ ව්‍යාපාරය පමණක් කරන්න. 'හොඳයි, බාබා, ඔබගේ අණ කුමක් වුවත්!' රජතුමා සමඟ වාසය කරනා අය කියනවා, 'ඔබගේ බලාපොරොත්තුව මාගේ විධානයයි!' රජවරුන් අණ දෙනවා නමුත්, මෙම අණ දීම කරන්නේ ශිව බාබායි. 'ඔබගේ අණ කුමක් වුවත්, ශිව බාබා!' කියා ඔබ නැවත නැවතත් කිව යුතුයි. එවිට ශිව බාබා අණ දෙන බව ඔබ අවබෝධ කර ගන්නා නිසා ඔබට සතුටින් සිටිය හැකි වේවි. ශිව බාබාව සිහිපත් කරනා විට ඔබගේ බුද්ධියේ අගුළු විවෘත වෙනවා. ශිව බාබා කියනවා මෙම පුහුණුව ඔබ වර්ධනය කළ යුතුයි, එවිට ඔබගේ ඔරුව එතෙර වී යනු ඇත. කොහොමනමුත්, අපහසුතාව ඇත්තේ ඔබ එය නැවත නැවතත් අමතක කර දැමීමයි. මායා ඔබට මෙය අමතක කරවනවා කියන්නේ ඇයි? ඔබ අමතක කර දමන නිසා සියල්ල කරන්නේ වැරදි ආකාරයෙනුයි. බොහෝ දරුවන් ඉතාමත් හොඳින් දැනුම කියා දෙනවා. නමුත් පව් විනාශ වී යන ආකාරයේ යෝගාවක් ඔවුන් තුළ නැහැ. එලෙස කිසිම ආකාරයකින් යෝගා නොමැති ඉතා හොඳ දරුවන් රාශියක් ඉන්නවා. ඔවුන් යෝගාවෙහි රැඳී නොසිටින බව ඔවුන්ගේ හැසිරීමෙන් පැහැදිලි වනවා. එහිදී ඔවුන්ට විඳවන්නට වන ආකාරයේ පාප ඉතිරිවෙනවා. මෙහිදී කුණාටු පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. එය ඔබේ වරද නිසා බව ක්ෂණිකව වටහා ගන්න මන්ද, ඔබ ශ්‍රීමත් පිළිපැද නැහැ. ඔබ මෙහි පැමිණ ඇත්තේ රාජයෝගා ඉගෙන ගැනීමටයි. පුරවැසියන් වීමට ඔබට යෝගා උගන්වන්නේ නැත (ප්‍රජා යෝගා). මව සහ පියා සිටී. ඔවුන් අනුගමනය කරමින් ඔබටද සිහසුන මත

අසුන් ගත හැකියි. ඔවුන් පිළිබඳවනම්, ඔවුන් ශ්‍රී ලක්ෂ්මි සහ නාරායන බවට පත් වනවාය යන්න නිශ්චිතයි. එමනිසා, මව සහ පියා අනුගමනය කරන්න. අන් ආගම්වල අය මව සහ පියා අනුගමනය නොකරයි. ඔවුන් පියා මත විශ්වාසය තබනවා පමණයි. මෙහි ඔබට දෙදෙනාම ඇත. පරමාත්ම දෙවියන් නිර්මාපකයාය. මව වනාහී අදෘශ්‍යමාන රහසකි. මව සහ පියා දිගටම ඔබව දැනුවත් කරයි. ඔවුන් ඔබට පැහැදිලි කර කියන්නේ මේ දේ නොකරන්න, මේ දේ කරන්න! ගුරුවරයෙක් ඔබට දඬුවම් කරන්නේනම් ඔහු එය කරන්නේ පාසැලේදීයි. ශිෂ්‍යයෙක්ට කියන්න බැහැ ඔබ මට අගෞරව කරනවා! කියා. ළමයින් පස් දෙනෙකු හෝ හය දෙනෙකු ඉදිරිපිට පියෙක් ඔබට පහරක් ගහන්නත් පුළුවන්. ළමයාට කියන්න බැහැ ඇයි ඔබ මට ළමයි පස් දෙනා හෝ හය දෙනා ඉදිරිපිට දී ගැහැව්වේ? කියා. නැහැ. මෙහිදී දරුවනට ඉගැන්වීමකුයි ලබා දෙන්නේ. ඔබට ඒවා අනුගමනය කළ නොහැකිනම්, එවිට නිවසෙහි හිඳිමින් උත්සාහ ගන්න. ඔබ මෙහි සිටින අතරතුර අනිසි ලෙස සේවය කරයිනම් එවිට ඔබ උපයා ගත් පුංචි දේ පවා විනාශ වී යාවි. ඔබට ඉගෙනගන්නට එපානම්, එහෙනම් එය අතහැර දමන්න! 'මට මෙය දිගටම කරගෙන යන්න බැහැ!' ඇයි ඔබ බාබාට නිගා කරන්නේ? බොහෝ දරුවන් සිටී සමහර අය ඉගෙන ගන්නා අතර අන් අය අත හැර යාවි. ඔබ සෑම කෙනෙක්ම ඔබේ ඉගෙනීමෙහි කුල්මත් බවින් රැඳී සිටිය යුතුයි. පරම පියා පවසයි: තම තමන් එකිනෙකා අතරෙහි සේවය අරගන්න එපා. එහි කිසිම අහංකාරයක් නොතිබිය යුතුයි. අන් අයගෙන් පෞද්ගලික සේවය ලබා ගන්නවා යනු ශරීර අහංකාරයයි. බාබා ඔබට පැහැදිලි කළ යුතුව තිබෙයි. එසේ නොවුණිනම්, අධිකරණයේදී ඔබ කියාවි මම නීති රීති දැන සිටියේ නැත කියා. මේ නිසයි පියා ඔබට සෑම දේම පැහැදිලි කරන්නේ. පසුවට, දර්ශන ගෙන දෙන අතර, අනතුරුව දඬුවම් ලැබෙයි තහවුරු කර නොගෙන දඬුවම් කළ නොහැකියි. බාබා පෙර චක්‍රයේ දී පැහැදිලි කළ ඒ අයුරින්ම ඔබට ඉතා උවමනාවෙන් පැහැදිලි කරයි. හැම කෙනෙකුගේම වාසනාව දිස්වෙයි. යම් අය සේවය කරමින් ඔවුන්ගේ ජීවිත දියමන්ති මෙන් කරගන්නා අතර, අන් අය ඔවුන්ගේ වාසනාව මකා ගනී. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පියාගෙන්, ගුරුවරයාගෙන් සහ සත්ගුරුගෙන් ඔබ ලබනා ඉගැන්වීම් අනුගමනය කරන්න. මායාට දොස් නඟන්න එපා. නමුත් ඔබේම දුර්වලතා පරීක්ෂා කරමින් ඒවා ඉවත් කරන්න.
2. අහංකාරය අතහැර ඔබේ ඉගෙනීමෙහි කුල්මත්භාවයෙහි රැඳී සිටින්න. කිසිවිටෙක අන් අයගෙන් කිසිම පෞද්ගලික සේවයක් නොගන්න. නරක ආශ්‍රයේ බලපෑමෙන් ඔබව හොඳින් ආරක්ෂා කරගන්න.

**වරදානය:** ඔබ නිරන්තරයෙන් ඔබගේ ආලෝකමත් කිරුළ පැලඳගෙන ඔබගේ සිතිවිලි වලින් සංඥා කිරීමෙන් ඔබගේ සියළු ක්‍රියාකාරකම් සිදු කරත්වා.

නිරන්තරයෙන් ආලෝකමත්ව සිටින දරුවන්ට කිසිම විටෙක ඔවුන්ගේ සිතිවිලි හෝ කාලය අපතේ හැරිය නොහැක. ඔවුන්ට තිබෙන්නේ ප්‍රායෝගිකව සිදු වීමට යන සිතිවිලි පමණයි. ඒ ගැන කතා කිරීමෙන් ඔබ යම් දෙයක් පැහැදිලි කරගන්නා සේම, ඔබගේ සියළු ක්‍රියාකාරකම් ඔබගේ සිතිවිලි මගින් සිදු කළ හැක. ඔබ මෙම ක්‍රමවේදය භාවිතා කරන විට, භෞතික ලෝකය, සූක්ෂ්ම කලාපය බවට පත් වෙයි. මේ සඳහා නිරන්තරයෙන් නිහැඬියාවේ බලය එක්රැස් කරගෙන නිරන්තරයෙන් ඔබගේ ආලෝකමත් කිරුළ පැලඳ සිටින්න.

**පාඨය:** මෙම දුක් ලෝකයෙන් ඉවතට පිය මනින්න එවිට දුක් රළ කිසි විටෙක ඔබ වෙතට නොපැමිණෙයි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබගේ විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් කරගෙන නිරන්තරයෙන් නොබියව සහ සැහැල්ලුවෙන් රැඳී සිටින්න.**

වාහනයක බටරිය ටිකක් දුර්වල වී, වාහනයට තනිව ගමන් කිරීමට නොහැකි වන විට එවිට ඔබට අන් අය ලවා එයට තල්ලුවක් දීමට සිදුවෙයි. ඒ ආකාරයෙන්ම, ඔබට ඒකායන කෙනා කෙරෙහි විශ්වාසය ඇති විට සහ එම ඒකායන කෙනාගෙන් ඔබට උපකාර ලබා ගත හැකි බව ඔබට හැඟෙන විට, එම ඒකායන කෙනාගෙන් උදව් ටිකක් ලබාගෙන ඉදිරියට ගමන් කරන්න. ඇති දුර්වලතා ගැන එතරම් නොසිතන්න, මන්ද ඔබට සතුටින් ඉදිරියට යාමට හැකි වන්නේ එවිට පමණයි.